# ජනශ්‍රැතියෙන් නිරූපිත නාථ දෙවි සහ පිටියේ බණ්ඩාර දෙවියන් අතර ගැටුම පිළිබඳ අධ්‍යයනයක්

ආචාර්ය අජිත් තල්වත්ත[1]

## හැඳින්වීම

මහින්දාගමනයෙන් පසුව වුව ද පැවති දෙවිදේවතා හා වෙනත් විශ්වාස සමාජය අත්හැර ගිය බවක් නො පෙනේ. වරින් වර ලංකාවට එල්ල වූ දකුණු ඉන්දියානු ආක්‍රමණ සමහර දේව ඇදහිලි සිංහලයන් අතර ප්‍රචාරය වීමට හේතු වූ අතර පොළොන්නරු යුගයේ පටන් එම ඇදහිලි මෙරට මුල් බැස ගනු දක්නට ලැබේ. තවද සිංහල සහ දෙමළ රජ පවුල් අතර සිදු වූ විවාහ සම්බන්ධතා ද මෙරට දේව මණ්ඩලය තුළට දෙවිවරුන් ඇතුළත් කරගැනීමේදී වැදගත් විය. හින්දු දෙවිවරුන්ට බෞද්ධ විහාර මන්දිර තුළට පිවිසීමට අවස්ථාව ලැබෙන්නේ ගම්පොල යුගයේදී ය. මහායානය නිසා බෝසත් වන්දනය විකාශනය වී මහත් සම්භාවනාවට ලක්වූ බෝධිසත්ත්වවරු මෙකල දෙවිවරු වූහ. බෝධිසත්ත්ව සංකල්පය ක්‍රමික ව විකාශනය වීමේ ප්‍රතිඵලයක් ලෙස මධ්‍යකාලීන ලංකාවේ අවලෝකිතේශ්වර හෙවත් නාථ දෙවියන්ට හිමි වූයේ සුවිශේෂී ස්ථානයකි. මෙරට ඉතිහාසයේ නාථ දෙවියන් වඩාත්, වැදගත් වන්නේ බෝධිසත්ත්ව තත්ත්වයේ සිට ක්‍රමිකව දේවත්වයට පත්වීමත් සමග ය. මුලදී අවලෝකිතේශ්වර බෝධිසත්වයන් ලෙස පුද පූජා ලැබූ මෙම දෙවියන් පසුකාලීනව බෝධිසත්ත්ව තත්ත්වයෙන් මිදී දේවත්වය ආරෝපණය කරගන්නා ආකාරය දක්නට ලැබේ. මෙතැන් පටන් අවලෝකිතේශ්වර ලංකාවේ හඳුන්වන ලද්දේ ඔහුගේ තවත් අභිධානයක් වන ලෝකේශ්වර නාථ යන්නෙහි කෙටි නම වන නාථ නමිනි. බෝධිසත්ත්වයන්ගේ සුලමුල මුළුමනින් ම යටපත්ව යන අතර, ඔහු උඩරට රාජධානියේ දේශපාලන උරුමය තහවුරුවීමට සම්බන්ධ ලෞකිකත්වයට නැඹුරු බලවත් ජාතික දෙවියකු බවට පත් විය. මෙම පසුබිම තුළ උඩරට ප්‍රදේශයේ නාථ දෙවියන් හා බද්ධ වූ සංස්කෘතියක් ඇති වේ.

## පර්යේෂණ ගැටලුව

නාථ දෙවියන් පිළිබඳව සිදුකරන අධ්‍යයනයේදී "නාථ සහ පිටියේ බණ්ඩාර දෙවිඳුන්" පාදක කරගෙන උඩරට ජනශ්‍රැතියේ පවතින කථා ඉතා වැදගත් වේ. මෙහි ප්‍රධාන පර්යේෂණ ගැටලුව වන්නේ සිංහලයේ අවසන් පාලකයා වූ වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගෙන් පසු "විදේශීය නායක්කාර්" රාජවංශය අතට පත්වීම සම්බන්ධ සිදුවීම නාථ හා පිටියේ දේව ගැටුමක් මගින් නිරූපණය වන බව තහවුරු කිරීමයි.

---

[1] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, ajiththalwatte@gmail.com



58075

**පර්යේෂණ ක්‍රමවේදය**

මේ සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීමේදී පුස්තකාල හා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ඇති ලේඛන ද යොදා ගැනීමට ද අපේක්ෂිත ය. තොරතුරු ලබාගැනීමේදී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය යොදාගන්නා අතර ජනශ්‍රැති කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ.

**විශ්ලේෂණය**

නාථ දේව වන්දනය කැලණිය ප්‍රදේශයේ ඇසුරෙන් ජනප්‍රියව පැවතින. සංදේශ කාව්‍යවල සඳහන් තොරතුරුවලට අනුව තොටගමුව ප්‍රදේශය වඩාත් ප්‍රකට වූයේ නාථ දේව වන්දනය සඳහා ය. නාථ දෙවි කැලණියේ සිට සෙංකඩගල පුරයට පැමිණීම මගින් සංකේතවත් කරන්නේ සිංහල රාජධානි පහතරට සිට උඩරටට ගෙන ආ බව විය හැකි බවට විශ්වාස කළ හැකි ය. මහවැලි ගං තෙර ඔස්සේ පැමිණ තැන්නේකුඹුර පාලමෙන් එගොඩ වූ පසුව එහි දකුණු පසින් පිහිටියේ දුම්බර රට ය. මෙම ප්‍රදේශයේ බලවත් ම දෙවියා ලෙස මහජනතාවගේ ගෞරවයට පාත්‍ර වී ඇත්තේ පිටියේ බණ්ඩාර දෙවියෝ ය. මොහු බණ්ඩාර දෙවිවරුන් අතර පුද පූජා ලබන දේව සහ යක්ෂ කොටස් දෙකට ම අයත් දෙවි කෙනෙකු වේ. පිටියේ බණ්ඩාර සොළී රට උපන් අයෙකු ලෙස විශ්වාස කළ ද දුම්බර ප්‍රදේශයේ ජනයා පිටියේ දෙවි මෙරට උපත ලැබූ දෙවි කෙනෙකු ලෙස සලකා වන්දනාමාන කරති.

උඩරට පාලනය කළ පළමුවන විමලධර්මසූරිය රජුගේ කාලයේදී දුම්බර ප්‍රදේශයේ මෙම දේව ඇදහිල්ල ආරම්භ වී ක්‍රමයෙන් ව්‍යාප්ත වී ඇත. ඉන්පසු අවසන් සිංහල පාලකයා වූ වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ යුගයේදී ද එය තව දුරටත් ප්‍රචලිත විය. මෙම රජු පිටියේ දෙවියන්ගේ ගුණ ගායනා කරවීමට කාව්‍යයක් රචනා කළ බව විශ්වාස කෙරේ. එකී කාර්ය පවරා ඇත්තේ දොඩම්වල කිවිඳුට බවත්, එම කාව්‍ය සංග්‍රහය "පිටියේ සුරිඳු පුවත" ලෙස හඳුන්වන බවත් ජනප්‍රවාදයේ සඳහන් වේ. මුල් කාලයේ දුම්බර බලවත් දෙවියන් වූයේ නාථ ය. සොළී රට සිට පැමිණි දුම්බර මිටියාවතට පැමිණි පිටියේ බණ්ඩාර දෙවි සුන්දර ප්‍රදේශයක් වූ දුම්බර මිටියාවත දැක සිය වාස භූමිය කරගැනීමට අදිටන් කරගෙන ඇත. ඉන් පසුව මෙම ප්‍රදේශයේ බලය පතුරුවා ගෙන සිටි මෛත්‍රී ගුණයන්ගෙන් යුත් නාථ දෙවි සමග සටන් කිරීමට උත්සාහ ගත්තේ ය. නමුත් නාථ දෙවිඳු ඔහු හා සටන් කිරීමට නොපෙලඹුණේ ය. නාථ දෙවි තමන් හා සටනට නොපැමිණි බැවින් අසල සිටි සතුන් අල්ලා අත්පා කඩා නාථ දෙවියන්ට එයින් දමා ගසන්නට පටන් ගත්තේ ය. තමා නිසා අසරණ සතුන් මරණයට පත්වන බව දුටු නාථ දෙවි දුම්බර අතහැර පස්ගමට ගොස් එහි වාසය කර ඇත. පස්ගම යන නාමය ඇති වී ඇත්තේ නාථ දෙවි "පසුබා ආ ගම" යන අරුතින් බව ජනප්‍රවාදයේ පවති. මෙම ගැටුම පිළිබඳව පස්ගම ප්‍රදේශයේ ද ජනතාව අතර ගොඩනැගී ඇති ජනප්‍රවාද සහ කවි තිබේ. එසේ ම නාථ දෙවියන්ට පහරදීමට පළමුව ගෝනා අල්ලා ගත් ස්ථානය "

ගෝනාවත්ත" නමින් හැඳින් වේ. පිටියේ බණ්ඩාර දෙවි දුම්බර ප්‍රදේශයේ ආධිපත්‍යය පතුරුවාගෙන ඇත්තේ මෙම සිදුවීමෙන් පසුව ය. තමාට පිටියේ දෙවි දවා අළු කිරීමට තරම් බලයක් තිබුණ ද නිකරුණේ මරණයට පත්වන සතුන් කෙරෙහි මෛත්‍රී සහගත ව නාථ දෙවි පසුබැසීමෙන් පසු නාථ බෝධිසත්වයෙකු බවට පත් වූවා යැයි උඩරට ප්‍රදේශයේ පවතින ජන කථාවල සඳහන් වේ.

ආචාර්ය ජෝන් හෝල්ට් පවසන්නේ නාථ දෙවිඳුන්ගේ තාවකාලික පරාජය මගින් අවශ්‍ය ආධ්‍යාත්මික ජයග්‍රහණය හුවා දක්වන බවයි. නාථ උඩරට ආරක්ෂා කරන දෙවියකුගේ තත්ත්වයෙන් වෙන් කොට ඔහු බෞද්ධයන්ගේ අවසාන ආධ්‍යාත්මික අරමුණ සමග සම්බන්ධ කරයි. නාථ යුද්ධයෙන් පිටියේ දෙවියන්ට පැරදුණු නමුත් අවසන් ජයග්‍රහණය ලැබුවේ ඔහු ය. උඩරට සිහසුන විදේශිකයන් සතු වූ විට සැදැහැති සිංහල බෞද්ධයන්ගේ තර්කානුකූල නිගමනය වූයේ නාථ දෙවිඳුන් ඔහු බව පවසයි. නාථ මතු බුදු වන බුදුන් යැයි සැලකීමෙන් මෙරට සිංහල ථෙරවාදී බෞද්ධ සංස්කෘතියේ ජනප්‍රිය සම්ප්‍රදායක් මගින් මහායානයේ අග්‍රසර ආදර්ශය නැවත පණ ගන්වා ආරක්ෂා කර ගනු ලැබිණි.

මෙම දෙවිවරු දෙදෙනාම කිසිදු භේදයකින් තොරව සිංහල බෞද්ධ පිරිස්වල වන්දනයට පාත්‍ර වෙති. ඉන් අවබෝධ වන්නේ එකම සමය-සංස්කෘතික සම්ප්‍රදායන් තුළ මෙම ඇදහීම් දෙකම එක් වී ඇති බවයි. තවද නාථ සහ පිටියේ බණ්ඩාර එකම දේව ගණය වූවත් එකිනෙකට වෙනස් ක්ෂේත්‍ර දෙකක් නියෝජනය කරති. මිනිසුන්ගේ එදිනෙදා ජීවිතයේ අවශ්‍යතා සහ බලාපොරොත්තු ඉටුකර දීමට පිටියේ බණ්ඩාර දෙවියන්ට හැකි ය. එහෙත් නාථ දෙවි තුළින් එකී අපේක්ෂා ඉටු නොවන බවත් ලෝකෝත්තර අරමුණු ඉෂ්ට කරදීමට හැකි බවත් උඩරටියෝ තදින්ම විශ්වාස කරති. පිටියේ දෙවියන් උඩරට සමාජය පිළිගැනීම හරහා ඉටුකරගත් තවත් අරමුණක් ඇත. එනම් ආර්ථික වශයෙන් ද වෘත්තියක් වශයෙන් ද උසස් වූ ගොවිතැන දියුණු කිරීමට උන්වහන්සේට බලයක් ඇතැයි සමාජය විසින් පිළිගැනීමයි. මෙම අදහස ඉදිරිපත් කිරීමට බලපෑ ප්‍රධාන සිද්ධිය වන්නේ එවකට ගුරුදෙණිය වෙල්යාය අස්වැද්දවීමට යාමට ප්‍රධාන බාධකය වූයේ ජලය නොමැති වීමයි. මෙම වෙල්යායට ජලය නොමැති වූයේ විශාල ගලක් තිබීම නිසා ය. මෙම අවස්ථාවේ පිටියේ දෙවියන් ඉදිරිපත්ව අදාළ පර්වතය බිඳහෙලා එම වෙල්ලයායට ජලය ඒමට සැලැස්වූ බවට ජනශ්‍රැතියේ සඳහන් වේ. එමගින් කෘෂිකාර්මක කටයුතු පහසුවීම තුළ පිටියේ දෙවියන්ගේ පිළිගැනීම ද ඇති විය. මෙම කෙතේ වී එදා සිට අද දක්වා ම ආගමික කටයුතු සඳහා යොදා ගනී. දළදා මාළිගාවේ ප්‍රධාන වී අටුව ද පිහිටා ඇත්තේ ගුරුදෙණියේ ය. මෙම කුඹුරෙන් ලබාගන්නා වී දළදා මාළිගාව ප්‍රමුඛ පැරණි විහාර දේවාලගම්වල වාර්ෂිකව පවත් වන අලුත් සහල් මංගල්‍යයට ද භාවිත කරනු ලබයි.

## නිගමනය

මහනුවර රාජධානි සමයේ සිට නැවත නාථ දෙවියන්ගේ වැදගත්කම ගොඩනැගෙන බව පෙනේ. දඹදෙණි, ගම්පොල හා කෝට්ටේ යන අවධීන්හි සිංහල සමාජයේ දේශපාලන කටයුතු කෙරේ දැඩි ලෙස බල පෑ නාථ දෙවිඳුන් ක්‍රමයෙන් බෝධිසත්ත්ව භාවයට පත්වීමත් සමග ඔහුගේ ලෞකික කාර්යයන් ක්‍රමයෙන් අඩු වේ. තවද බාහිර දෙවි කෙනෙකු ලෙස පිටියේ දෙවියන් උඩරට ප්‍රදේශයේ බලය පිහිටුවා ගැනීම සංකේතවත් කරන්නේ නරේන්ද්‍රසිංහ රජුගෙන් අවසන් වන සිංහල රජ පෙළපතට පසු නායක්කාර්වරුන්ගේ බලය ස්ථාපිත වීම සංකේතවත් කරන බවකි. තවද උඩරට පාලකයන් රාජ්‍යත්වයට පත්වීමට පෙර නමක් තෝරාගැනීමේදී හා ඔටුනු පැලඳීම සිදු කර ඇත්තේ මහනුවර නාථ දේවාලය ඉදිරිපිට ය. විදේශීය රජ පෙළපතක් පාලනය කළත් බෝසත් බවින් යුතු නාථ දෙවිඳුන් කෙරෙහි විශාල බලයක් පැවති බව පෙනේ. එම බලය මගින් සංකේතවත් වන්නට ඇත්තේ සිංහල බෞද්ධ පසුබිම විය යුතුය. නාථ වන්දනය මෙම යුගයේදී වඩාත් සීඝ්‍රයෙන් රජමැදුර සහ ගැමි ජනතාව අතර ජනප්‍රිය වූ බවට මහනුවර දළදා මැදුර අබියස ඇති නාථ දේවාලයත්, වේගිරිය, පස්ගම හා දොඩම්වල යන නාථ දේවාලත් සාක්ෂ්‍ය දරයි. මෙරට සෑම රජ කෙනෙකු ම බෝධිසත්ත්වයෙකු යයි දහවෙනි සියවසේ අභයගිරිවාසී භික්ෂූන් පිළිගත් සම්ප්‍රදාය පසුකාලයේ ලංකාවේ රජවරු ද භාවිතයට ගත්තෝ ය. උන්වහන්සේ ලංකාරක්ෂක වරම් දෙවිවරුන් අතර අග තැන වැජඹුණහ. මහනුවර යුගය වන විට සිවු දේවාල සඳහා අධිග්‍රහිත ප්‍රධාන දෙවියන් වන්නේ නාථ ය.

ප්‍රමුඛ පද; අවලෝකිතේශ්වර, බෝසත් වන්දනය, මෛත්‍රී ගුණය, ලෞකික, නායක්කාර්වරු

## ආශ්‍රිත ග්‍රන්ථ

අස්සජී, තල්පේ. (1998). *ජනකවිය දෙවියෝ හා යක්ෂයෝ,* කොළඹ: ඇස්. ගොඩගේ සහ සමාගම.

කාරියවසම්, තිස්ස. (1991). *සිරිලක දෙවිවරු*, හියු නෙවිල් එකතුව ආශ්‍රයෙනි, කොළඹ: තරංජි ප්‍රින්ටස්.

දේවපිය, සිරිසේන. (1993). ජනප්‍රවාද සහ ජනවහර, නුවරඑළිය: කෞශල්‍යප්‍රකාශන.

ධර්මදාස, කේ.එන්.ඕ., තුන්දෙනිය, එච්.එම්.එස්., (1994), *සිංහල දේව පුරාණය,* පාදුක්ක: මුද්‍රණ නීතිගත සංස්ථාව.

ධර්මාරාම, අහංගොඩ. (2004). ප්‍රකට දෙවිවරු, රත්මලාන: විශ්වලේඛා.

ධම්මානන්ද, නාවුල්ලේ. (1969). මධ්‍යම ලංකා පුරාවෘත්ත, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

හෝල්ට්, ජෝන් ක්ලිෆර්ඩ්. (1994). *මකුට මුනිධාරි අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය,* පරි. පී.බී. මීගස්කුඹුර, කොළඹ: ප්‍රදීප ප්‍රකාශන.